# පාසල් වෘත්තීය මාර්ගෝපදේශ සේවාවන්හි ඵලදායකත්වය


එච්.ටී.කේ. වික්‍රමසිංහ
**709080706**


අධ්‍යාපනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධනයකි.


අධ්‍යාපන පීඨය
ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
නාවල
**2013** නොවැම්බර්



OPEN UNIVERSITY
70891

70891

# සංක්ෂිප්තය

පර්යේෂණයක අරමුණු අතර ප්‍රධාන වන්නේ නව දැනුම ලබා ගනිමින් පවතින ගැටළුවලට විසඳුම් සොයා ගැනීමයි. පර්යේෂණයක් පියවර ගණනාවක් ඔස්සේ සිදු කරන අතර ගැටළුව තෝරා ගැනීම, ගැටළුව හැඳින්වීම, අධ්‍යයනයේ පසුබිම දැක්වීම, අධ්‍යයනයේ වැදගත්කම පැහැදිලි කිරීම, පර්යේෂණ මාතෘකාවට අදාළ සංකල්ප නිර්වචනය කිරීම එහි ප්‍රථම භාගය ලෙස දැක්විය හැකිය.

පර්යේෂණයේ අරමුණු ලෙස ,

1. පාසල් වෘත්තීය මාර්ගෝපදේශ සේවය ක්‍රියාත්මක වන ආකාරය සොයා බැලීම.

2. පාසල් වෘත්තීය මාර්ගෝපදේශ සේවා ඒකකවල ඵලදායකත්වය පිළිබඳව විදුහල්පතිවරු , ගුරුභවතුන්, සිසුන් දරන අදහස් විමසීම.

3. විද්‍යාලතලයේ පසුවන සිසුන් සඳහා සලසා ඇති වෘත්තීයාභිමුඛ කිරීමේ ප්‍රයත්න පිළිබඳව විමර්ශනය කිරීම.

4. වෘත්තීය මාර්ගෝපදේශ සේවා ඒකක ක්‍රියාත්මක කිරීමේදී ඒවායේ සාර්ථක හෝ අසාර්ථක භාවයට හේතු වන ප්‍රබලතා සහ දුබලතා හඳුනාගැනීම.

5. එම දුබලතා අවම කිරීමටත් ප්‍රබලතා දියුණු කිරීමටත් යෝජනා ඉදිරිපත් කිරීම, දැක්විය හැකි ය.

පර්යේෂණය සඳහා තම අවබෝධය පුළුල් කර ගැනීමට, සාහිත්‍ය විමර්ශනය තුළින් ගැටළුවලට අදාළව අතීත දැනුමත්, වර්තමාන දැනුමත් ළඟා කර ගත හැකිය. පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළව දැනට පවතින න්‍යායන්, අර්ථ දැක්වීම් පිළිබඳව සොයා බැලීමක් සාහිත්‍ය විමර්ශනය තුළින් සිදු කෙරේ. පර්යේෂණාත්මක සාහිත්‍ය විමර්ශනය තුළින් වර්තමාන පර්යේෂණයට ලබා ගත හැකි ආලෝකය දැක්වීම ද අපේක්ෂිත ය.

පර්යේෂණ ගැටළුව අධ්‍යයනයට යොමු කරන ආකාරය විස්තර කිරීමක්, පර්යේෂණ ක්‍රමවේදයෙන් සිදු කරයි. පර්යේෂණ පිරිසැලසුම තීරණය කිරීමේදී ගැටළුවේ ස්වභාවය, අරමුණු, නියැදියේ ගති ලක්ෂණද, සැලකිල්ලට ගනිමින් නියැදි සමීක්ෂණ ක්‍රමය යොදා ගන්නා ලදි. පර්යේෂණයේ දත්ත ලබා ගැනීම සිදු කරනුයේ නියැදිය මූලික කරගෙනයි. පර්යේෂණයේ ජනගහනය ලෙස ශ්‍රී ලංකාවේ වෘත්තිය මාර්ගෝපදේශය ක්‍රියාත්මක වන සියලුම පාසල් සැලකුවද රටම නියෝජනය වන පරිදි නියැදිය තේරීම අසීරු කරුණකි. එම නිසා සහේතුක නියැදි ක්‍රමයට ගාල්ල අධ්‍යාපන කලාපයේ වෘත්තිය මාර්ගෝපදේශය ක්‍රියාත්මක වන පාසල් 6 ක් තෝරා ගන්නා ලදි. එම 1AB පාසල් 6 තුළින් අහඹු නියැදි ක්‍රමයට සිසු නියැදිය තෝරා ගන්නා ලදි. පර්යේෂණ ක්‍රමය යටතේ සමීක්ෂණ ක්‍රමය භාවිතා කරන ලදී.

පාසල් වෘත්තිය මාර්ගෝපදේශ සේවය පාසල් තුළ පවත්වා ගෙන යාමේදී ඇතිවන ගැටළු සහ එම ගැටළු විසඳීමට පාසල් තුළින් ලද යෝජනා, වගු මගින් විස්තරාත්මකව ඉදිරිපත් කරන ලදී.

වෘත්තිය මාර්ගෝපදේශ සේවය පිළිබඳ සිදු කළ පර්යේෂණයේදී දත්ත විශ්ලේෂණයෙන් ලද සොයා ගැනීම් තුළින් පර්යේෂණ නිගමන ඉදිරිපත් කර ඇත.

පර්යේෂණ නිගමන ඇසුරින් පර්යේෂණ යෝජනා විස්තරාත්මකව, සාරාංශ ගතවද, ව්‍යුහගතවද , වගු ලෙසද, ඉදිරිපත් කෙරේ.

පර්යේෂණය සමාප්තියේදී අනාගත පර්යේෂණ සඳහා ඉඟි ලබාදීමක් ද සිදු කර ඇත. පර්යේෂණයේ සොයා ගැනීම් සහ යෝජනා ජාතියේ දරුවන්ට අනාගත වැඩ ලෝකයට පිවිසීමට මහෝපකාරයක් වනු ඇත.

## Abstract

Among others the main purpose of a research is to gain further knowledge and to find solutions to the existing problems. A research is carried out in several stages and the first stage thereof is the sorting out of the problem,the introduction of the problem,the interpretationof theback ground of the problem, the explanation of the importance of the study and the interpretation of the idea relevant to the topic of the research.

The objectives of the research are –

1. To find how the school vocational guidance service is functioning.

2. To inquire the ideasof the principals, teachers and studentsabout theeffectiveness of the school vocational guidance service units.

3. To investigate the attempts made to professionally orient the students.

4. To identifystrengths and weaknesseswhich cause success or failureof conducting vocational guidance serviceunits.

5. To make suggestions to minimize the weaknesses and to enhance strengths.

The relevant knowledge gained in the past and at present through the literature could be used to widen the understanding needed for the research. By the investigation made through literature an inquiry is made with regard for the theories and an interpretation exiting presently with regard to the field or research. The presentation of the enlighten which the present research could gain though the experimental investigation as also expected

The method of research also presents the manner in which the problem of research is referred for the study. In determining the prior planning of the research the method of sample survey was used while taking in to consideration the nature of the problem, the purpose and the features of the sample In obtaining data for the research. Although all the schools in which the vocational guidance is implementedin Sri Lankaare treated as the research population the selection of the sample to represent the whole country is very difficult. As such 6 schools in the Galle educational zone where the vocational guidance isimplemented were selected as per the purposive sampling method. Out of those six 1 AB schools, the student sample was selectedas per the random sampling method. The survey method was used for the research.

The problems arising when the school vocational guidanceunits wereconducted in schools and the proposals received through the schools were descriptively presented in tables.

The conclusionsmade in the research on the vocational guidance service through the findings made in analyzing the date are forwarded.

The suggestions based on the conclusions of the research are presented descriptively, concisely, structurally and as tables.

At the conclusion of the research clues for the future research are indicated. The findings and proposals made though the research would be highly helpful for the children of the nation in there entrance to the future vocational world.